# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1996/29 - 2016 දෙසැම්බර් මස 06 වැනි අඟහරුවාදා - 2016.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* නුඑ/3/1/8/අත්පත්/160.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/10/2013/යූඩීඒ/639.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළයේ සුළු කොට්ඨාසයේ, (කොට්ඨාස අංක 07 පාක් රෝඩ් - සහ නුවරඑළිය මහ නගර සභාව සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු. පි. නු. 1840 හා 1996.11.30 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 සහ 2 ලෙස පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 5.9181 ක් පමණ වන ඉඩම් කොටස:

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: ඕක්ලිකොටේජ්; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 20-100 වයසැති සයිප්‍රස් ගස් 10ක්ද, අවුරුදු 35-85 වයසැති ඇකේසියා ගස් 132ක්ද, අවුරුදු 40-80 වයසැති ටර්පන්ටයින් ගස් 9ක්ද, අවුරුදු 30-70 වයසැති ඉන්දියන් කාන්තාර ගස් 39ක්ද, ස්ථිර ගොඩනැගිල්ලක්ද ඇත; හිමිකම් කියන අය: කෙල්සී ඩෙවෙලොපර්ස් පුද්ගලික සමාගම, දුනම්ස් කැපිටල් පුද්ගලික සමාගම සහ නෙක්ට්වෙන්චර්ස් පුද්ගලික සමාගම; ප්‍රමාණය: හෙක්. 5.2639.

01. **කැබලි අංක 2**
ඉඩමේ නම: ඕක්ලිකොටේජ්; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 20 පමණ වයසැති සයිප්‍රස් ගස් 1ක්ද, අවුරුදු 35 පමණ වයසැති ඇකේසියා ගස් 3ක්ද, අවුරුදු 30 පමණ වයසැති ඉන්දියන් කාන්තාර ගස් 33ක්ද ඇත; හිමිකම් කියන අය: කෙල්සී ඩෙවෙලොපර්ස් පුද්ගලික සමාගම, දුනම්ස් කැපිටල් පුද්ගලික සමාගම සහ නෙක්ට්වෙන්චර්ස් පුද්ගලික සමාගම; ප්‍රමාණය: හෙක්. 0.6542.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2017 ජනවාරි මස 03 දින පෙරවරු 11.00 ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.


1A - G 24699 - 27 (2016/12)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

තවද 2016.12.28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2016 දෙසැම්බර් මස 05 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-859

---

සංශෝධනයයි

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

2016.11.21 වැනි දින අංක 1994/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට්* පත්‍රයෙහි, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1158 අස්සැද්දුම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැන පිළියෙල කළ අංක කේයූ/කේපීඩබ්ලිව්/2016/477 හා අ.ග.පි. 976 හි අතිරේක අංක 13, පත්‍ර අංක 8 දරන පිඹුරෙහි කැබලි අංක 73, 74 යන ඉඩම්වලට අදළ සිංහල භාෂා නිවේදනයෙහි, ''ඉඩම් සම්බන්ධයෙන් අයිතිවාසිකම් දක්වා සිටිය යුතු අවසන් දිනය වශයෙන් 2016 දෙසැම්බර් මස 31 දිනය පළකර ඇති නමුත් එම දිනය, 2016 දෙසැම්බර් මස 13 වැනි දිනය ලෙස නිවැරදි විය යුතුයි.''

එන්. එම්. ජේ. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
කුලියාපිටිය බටහිර කොට්ඨාසය.

2016 දෙසැම්බර් මස 06 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුලියාපිටිය-බටහිර.

12-860

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.